# සාම සංස්කෘතියක් හැඩගැස්වීමෙහි ලා ජනමාධ්‍යවේදයේ ශක්‍යතාව පිළිබඳ විමර්ශනයක්

ආචාර්ය ලියනගේ ටියුඩර් වීරසිංහ

**සාරාංශය**

20 වන සියවස තරම් මානව සමාජයේ විවිධ ක්ෂේත්‍ර අතර අන්තර් ක්‍රියාකාරී ඒකාග්‍රතා ප්‍රවණතා වර්ධනය වූ සියවසක් දැකිය නො හැකි ය. විද්‍යාවේ හා තාක්ෂණයේ වර්ධනය ඊට මූලික වසයෙන් දායක වූ අතර එමගින් මානව සමාජයේ සියලු ක්ෂේත්‍ර සංශ්ලේෂීය ඒකීය සමස්තයක් බවට පත්විය. මේ තත්ත්වය යථාර්ථය පරාවර්තනය කිරීමේ මානව ප්‍රජානන ක්‍රියාවලිය තුළ ද සංශ්ලේෂීය ප්‍රවණතා ශක්තිමත් කළේ ය. එහි ප්‍රතිඵලයක් වසයෙන් බහු විෂයික, අන්තර් විෂයික හා පාර විෂයික ශික්ෂණ ක්‍රමවේද වර්ධනය විය.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව වර්ධනය වූ ගැටුම් වේදය හා සාම වේදය මෙම විෂයාන්තර සංශ්ලේෂීය නැඹුරුව මනා ව ප්‍රදර්ශනය කරන විෂය ක්ෂේත්‍ර දෙකකි.

මානව සමාජය වර්ධනය වී තිබෙන ආකාරය නිසා ගැටුම් හා ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් ඇතිවීම සාමාන්‍ය ස්වභාවයකි. ගැටුම් මානව සමාජය සමස්තයක් වසයෙන් පැවැත්මේ සහ එය වර්ධනය විමේ ස්වරූපයකි. මුළු මානව ඉතිහාසය ම යනු විවිධ පුද්ගලයින්, ගෝත්‍ර සමාජ පංති, කණ්ඩායම්, ජනවර්ග, ජාතීන්, සංස්කෘතීන්, සමාජ ක්‍රම හා ශිෂ්ටාචාර අතර නිරන්තර ගැටුම්වල ප්‍රතිඵලයකි. මානව සංහතියේ වත්මන් මුහුණුවර සකස්වීම කෙරෙහි මුළු ඉතිහාසය පුරා ම සිදු වූ ගැටුම් අති විශාල දායකත්වයක් සපයා තිබේ.

නමුත් සමස්ත සමාජ ජීවිතය ම ගැටුමට පමණක් ඌණනය කළ නො හැකි ය. ඊට සමගාමීව මිනිස් සමාජය තුළ අන්‍යෝන්‍ය සහයෝගීතාව, හා සාමකාමී සහජීවනය ප්‍රවණතාවක් වසයෙන් පවතී. ඒත් එම තත්ත්වයන් ඇති

වන්නේ ගැටුම් රහිත බව නිසා ම නොව ගැටුම් සහිත බව නිසා ය.

ගැටුම් වේදය හා සාමවේදය අන්තර්විෂයික හා බහු විෂයික නැඹුරුවක් දරන විෂයක් වසයෙන් ඊට අයත් වන්නේ දර්ශනය, සමාජවිද්‍යාව, සමාජ මනෝවිද්‍යාව, ගතික මනෝවිද්‍යාව, දේශපාලන ආර්ථිකවිද්‍යාව පමණක් නොව ජනමාධ්‍යවේදය ද ගැටුම් වේදය හා සාම වේදය සඳහා අත්‍යවශ්‍ය විෂය පරාසයකි.

සමාජ ක්‍රියාවලීන් පාලනය කිරීමේ හා මෙහෙයවීමේ මූලික සාධක අතර තොරතුරුවලට හිමි වන්නේ සුවිශේෂීය ස්ථානයකි. විශේෂයෙන් ම සමස්ත මානව ක්‍රියාකාරකම් පාලනය කිරීමේ හා හැසිරවීමේ ප්‍රධාන බලවේගයක් බවට වර්තමානයේ දී ජනමාධ්‍යවේදය පත්ව තිබේ. මේ නිසා සමාජ තොරතුරු ක්‍රියාවලිය නිසි පරිදි නියාමනය කිරීමේ හා විශේෂයෙන් ම ජනමාධ්‍යවේදය ඇසුරෙන් ගැටුම් පාර්ශ්වවල චලනයන් කෙරෙහි බලපෑමක් සිදු කළ හැකි ය. මේ මගින් සමාජය තුළ සාම සංස්කෘතියක් හැඩගැස්වීමෙහි ලා ජනමාධ්‍යවේදය යොදාගත හැකි වන්නේ මනා තොරතුරු නියාමනයක් හරහා ගැටුම් පාර්ශ්වයන්හි ප්‍රතිවිරෝධතාවන් සංතුලනාත්මක ව සමෝධානය කිරීමේ දීර්ඝකාලීන වූ ද අඛණ්ඩ වූ ද භාවිතයක් ඔස්සේ ය. එම තොරතුරු නියාමනය ගැටුම්වලට තුඩු දෙන සමාජීය ව්‍යුහයන්වල ශක්‍යතාව නිශේධනය කිරීම කෙරෙහිත් සමාජ සාමය සහ සහයෝගීතාව තහවුරු කරන සමාජීය ව්‍යුහයන් ශක්තිමත් කිරීම කෙරෙහිත් අවධානය යොමු කළ යුතු වන්නේ ය.

## හැඳින්වීම

සමාජය තුළ නිරතුරු ව උද්ගත වන කෘත්‍රිම හා ස්වාභාවික ගැටුම්, ව්‍යසන හා ප්‍රතිරෝධතා නිසා සමාජීය හා මානව සබඳතා බිඳවැටී සමාජීය ප්‍රචණ්ඩත්වය හා නොසන්සුන්තාව උත්සන්න වන්නේ ය. මෙය සමාජ සාමයේ පැවැත්මට ප්‍රබල තර්ජනයකි.

පශ්චාත් දෙවන ලෝක යුද සමයේ සිට සමාජ, දේශපාලන, සංස්කෘතික මතවාදී ක්ෂේත්‍ර කෙරෙහි සුවිසාල බලපෑමක් කරන සමාජීය ආයතනයක් වශයෙන් ජනමාධ්‍යවේදය වර්ධනය විය. ජනමාධ්‍යවේදය මිනිසාගේ සමාජීය ක්‍රියාකාරීත්වයේ සම්පිණ්ඩිත මනෝ මූලික ප්‍රකාශනයක් පමණක් නොව එම ක්‍රියාකාරීත්වයට අවශ්‍ය කරන්නා වූ දිසානතියක් හා හැඩහුරුවක් සැපයීමට සක්‍රිය ව දායක වන මානව සමාජ ජීවිතයේ සංයුක්ත කොටසකි

මේ නිසා සාම සංස්කෘතියක් හැඩ ගැස්වීමෙහි ලා ජනමාධ්‍යවේදය සතු ශක්‍යතාව අති විශාල වන්නේ ය. ජනමාධ්‍යවේදය සමාජීය ආයතනයක් වශයෙන් එය සමස්ත සමාජ ව්‍යූහය ඇසුරෙහි ක්‍රියාත්මක වන අතර අදාළ සමාජයේ මූලික ගති ලක්ෂණ අනිවාර්යයෙන් ම ජනමාධ්‍යවේදයට ආවේණික වන්නේ ය. අද්‍යතන සමාජය තුළ ජනමාධ්‍යවේදය ආර්ථික, දේශපාලන, සංස්කෘතික ව්‍යූහයන්ගේ අන්‍යෝන්‍ය සබඳතාව තුළ ක්‍රියාත්මක වෙයි.

සමකාලීන සමාජයේ සමාජීය සහ සංස්කෘතික ස්වරූප, ශෛලීන්, චර්යාවන් සහ චින්තනක්‍රම හැඩගැසීම කෙරෙහි ජනමාධ්‍යවේදයේ බලපෑම අතිවිශාල ය. ජනමාධ්‍යවේදය මිනිසාගේ ක්‍රියාකාරකම් පාලනය කරන, මෙහෙයවන, දිශානතිගතකරවන ප්‍රධාන සාධකයකි මෙම ලිපිය මගින් සාම සංස්කෘතියක් හැඩගැස්වීමෙහි ලා ජනමාධ්‍ය සතු ශක්‍යතාව අධ්‍යයනය කරන අතර එය හරහා සමාජයේ අර්බුදකාරී හා ගැටුම්කාරී තත්ත්වයන් අවම කර ගැනීමේ හැකියාව පෙන්වා දෙනු ලැබෙයි. එමගින් සාපේක්ෂ සාම සංස්කෘතියක් ගොඩනැගීමේ හැකියාව විග්‍රහ කෙරේ. සාම සංස්කෘතියක් යනුවෙන් අදහස් කරනු ලබන්නේ අර්බුද හෝ ගැටුම් නොමැති මානව සමාජයක් බිහිකිරීම නොව ගැටුම් හා අර්බුද නිශ්චිත ගතික සමතුලිත රාමුවක් තුළ කළමනාකරණය කරගැනීමේ මාදිලියකි. ගැටුම් පිළිබඳ ව සාමාන්‍යයෙන් මිනිසුන් අතර පවතින්නේ ඍණාත්මක හා අයහපත් ආකල්පයකි. එය ගැටුම් ඇතුලු සමාජීය ප්‍රපංචයක් තුළ ආධිපත්‍ය දරන සදාචාරීය හා ආචාරධර්මීය ප්‍රවේශයේ ප්‍රතිඵලයකි. නමුත් ගැටුම් හා අර්බුද එවැනි රේඛීය,

ඒකමානීය යන සරල ආකල්පය වැරදි සහගත වෙයි. මක්නිසාද යත් ගැටුම් හා අර්බුද මානව සමාජීය පැවැත්මේ සංවර්ධනයේ හා පාලනයේ සාධනීය හා ධනාත්මක කාර්යයභාරයක් ද ඉටු කරන බැවිනි. විවිධ හේතු නිසා හටගන්නා ගැටුම් සමාජීය ප්‍රගමනය සඳහා නිර්මාණශීලීව කළමනාකරණය කරගැනීම සහ වාර්තා කිරීමට හැකියාව ජනමාධ්‍යවේදය තුළ තිබේ. නමුත් පවතින සමාජ, දේශපාලන, ආර්ථික ක්‍රමය මත ජනමාධ්‍යවේදයට එය ඉටුකිරීමට තිබෙන හැකියාව සීමා වෙයි.

සාමය යන වදන කණ වැටුන විගස මිනිසුන් එය සංජානනය කරගන්නේ එහි ප්‍රතිවදන වන යුද්ධය හරහා ය. ඇත්ත වශයෙන් ම සාමය යනු යුද්ධයේ ප්‍රතිපාර්ශ්වය කි. එසේ නොවේ නම් එයත් ඇතුලුව ඊට වඩා පුළුල් හා ගැඹුරු පරාසයක් ඔස්සේ පැතිරයන සංකල්පයකි. සත්තකින් ම සාමය යනු යුද්ධයේ ප්‍රතිපාර්ශවයට වඩා පුළුල් වූ ද ගැඹුරු වූ ද මිනිසුන් අතර, ජනතාවන් අතර, රාජ්‍යයන් අතර සබඳතාවන්ගේ තත්ත්වයකි. සන්නද්ධ බලයෙන් හා තර්ජනයෙන් තොර ව මිනිසුන් අතර, ජනතාවන් අතර, රාජ්‍යයන් අතර ගොඩනැගෙන අන්‍යොන්‍ය සබඳතාවන් සාමකාමී තත්ත්වයේ මූලික ලක්ෂණයකි. මෙය අවසාන වශයෙන් සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික සාධක සංකීර්ණයක් මත නිර්ණය වන තත්ත්වයකි. සාමය මේ හෝ ඒ දෙයෙහි පැවැත්මේ මාධ්‍යයකට වඩා මිනිසාගේ සමාජ පැවැත්මේ එක් ස්වරූපයකි. එසේ ම එය ඔහුගේ සකලවිධ සමාජ ක්‍රියාකාරීත්වයේ කොන්දේසියකි.

සාමය මානව ජීවිතය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය කොන්දේසියක් ලෙස සැමදාක ම පැවතුණි. වර්තමානය වන විට සාමය මුළු මහත් මානව සංහතියේ පැවැත්ම සඳහා අන් කවරදාටත් වඩා අත්‍යවශ්‍ය කොන්දේසියක් බවට පත් වී තිබේ. එය මිනිසුන්ගේ ජීවිතයේ හා ක්‍රියාකාරිත්වයේ නිර්විකල්පීය ආකාරයක් බවට පත් වී තිබේ.

සාමය හා යුද්ධය යන වචන දෙක පෘථිවියේ ජීවත්වන කුඩා සහ විශාල සෑම ජනතාවන්ගේ වාග් මාලාවට ඇතුළු වී තිබේ.

යුද්ධය මානව සංහතියේ දුර ඈත අතීතයේ සිට ම සගයෙකි. එය මානව ශිෂ්ටාචාරයේ සෑම යුගයක ම එකට ගමන් කොට තිබේ. මානව සංහතියේ ඉතිහාසය මිනිසුන්, ගෝත්‍ර, ජනවර්ග, ජාතීන්, රටවල්, සංස්කෘතීන්, සමාජ ක්‍රම හා ශිෂ්ටාචාර අතර අරගලයකි. මේ අනුව මානව සංහතියේ දේශපාලන ඉතිහාසය සැලකිය යුතු අන්දමට යුද්ධවල ඉතිහාසයකි. විවිධ මිනිසුන්, රාජ්‍යයන්, ජාතීන්, සමාජ ක්‍රම අතර සතුරු, ප්‍රතිපක්ෂ සම්බන්ධතාවන්ගේ ස්වාභාවික ප්‍රතිඵලයක් වසයෙන් යුද්ධය ඇතිවෙයි.

සාමය පිළිබඳ ප්‍රශ්නය මානව ඉතිහාසයේ සෑම දාක ම වාගේ වැදගත් ප්‍රශ්නයක් වසයෙන් ක්‍රියාකරමින් මානව සමාජය සංවිධානය වීම හා එහි වර්ධනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදුකොට තිබේ. මානව ඉතිහාසයේ විවිධ චින්තකයින්, දාර්ශනිකයින්, දේශපාලනඥයින් ඇතුළු සමාජ ක්‍රියාකාරීන් මානව සමාජ සාමය පිළිබඳ ගැටලුව කෙරෙහි සිය විශේෂ අවධානය යොමු කොට තිබෙන බව පෙනේ (Bales 1937:66). මහා බ්‍රිතාන්‍යයේ සාම ව්‍යාපාරයේ ප්‍රධාන පෙළේ ක්‍රියාකාරිකයකු වූ මාම්ෆෝර්ඩ් සාමය නිරපේක්ෂ නිර්ප්‍රචණ්ඩත්වයට සමාන කළේ ය (Mumford 1937:15-16). සාමය පිළිබඳ අදහස්, සංකල්ප හා න්‍යායන් සමස්තයක් ලෙස නියෝජනය කරන සාමවාදයේ මානව සංහතිය න්‍යෂ්ටික යුගයට අවතීර්ණ වීමට බොහෝ කලකට පෙර බිහි වූ බව ඉතිහාසයේ පෙනේ. ලෝකයේ ප්‍රථම සාමාවාදී සංවිධානය පශ්චාත් නැපෝලියානු යුධ සාමයේ දී එංගලන්තයේත් ඇමෙරිකා එක්සත් ජනපදයේත් බිහි විය. 19 වන සියවෙසේ 80 හා 90 දශකවල දී සාමාවාදී ව්‍යාපාරය ඉතා පුළුල් ලෙස ලෝකය පුරා ව්‍යාප්ත වන්නට විය.

ප්‍රථම ලෝක යුද්ධ සමයේ දී සාමාවාදීහු මේ යුද්ධයට පමණක් නො ව පොදුවේ සියලු ම යුද්ධවලට එරෙහි ව ඉදිරිපත් වූහ. ඔවුහු ඕනෑම ආකාරයක සාමයකට එකඟ වූහ. නමුත් ඉතිහාසයේ පෙන්වන ආකාරයට විවිධ යුද්ධ පමණක් නො ව, විවිධ සාමයන් ද පැවතිය හැකි ය. ප්‍රථම ලෝක යුද්ධය පැවති කොන්දේසි තුළ ද සාමය පිළිබඳ සටන් පාඨය

සාමාජ පන්තික ස්වභාවයෙන් විනිර්මුක්ත ව අවබෝධ කරගත් බව පෙනේ. පශ්චාත් දෙවන ලෝක යුද්ධ කාලය තුළ සාම්ප්‍රදායික සාමවාදී අදහස් බටහිර ලෝකය පුරා ම ව්‍යාප්ත වන්නට විය. මෙහි මූලික අදහස වූයේ යුද්ධ අන්තරායන්ට හා යුද්ධයට බලහත්කාරී නො වන, අහිංසාවාදී ආකාරයට විරෝධය පෑම යි. මේ ප්‍රවේශය මිනිසාගේ පුද්ගලික උදාර භාවයේ ස්ථාවරය පිළිබිඹු කළත් මෙය සාම සංස්කෘතියක් සඳහා වූ සංකල්පීය පදනමක් වසයෙන් සැලකිය නො හැකි ය. මක් නිසාද යත් සාමය යනු සමාජය මතුපිටින් පෙනෙන දෙයකට වඩා සමාජයේ ගැඹුරට විහිදී යන මානව පැවැත්මේ තත්ත්වයක් නියෝජනය කරන සමාජීය ව්‍යුහයක් බැවිනි. විවිධ ආගමික දාර්ශනික මතවාද මගින් සාමය නිරූපණය වුවත් සාමය උපදින්නේ විවිධ ආගමික දාර්ශනික මතවාද තුළ නො වේ. සාමය උපදින්නේ හා පවතින්නේ මානව සමාජ පැවැත්මේ ව්‍යුහීය සබඳතා මගිනි.

පසුගිය අවුරුදු 4000 ක පමණ මානව සංහතියේ ඉතිහාසය තුළ යුද්ධමය නො වන, පූර්ණ සමකාමී තත්ත්වයේ පැවතී ඇත්තේ අවුරුදු 300 ක් පමණි. අවුරුදු 3700 ක ඉතිහාස කාල පරාසය තුළ අපේ ග්‍රහලෝකයේ කුමන හෝ කොටසක විශාල සහ කුඩා යුද්ධ 14550 ක් සිදුවී තිබේ. 20 වන ශතවර්ෂය ආරම්භය දක්වා ම එම යුද්ධ කලාපීය හෝ ප්‍රදේශීය ස්වරූපයක් ගත් අතර ඉන් අනතුරු ව එය ලෝක යුද්ධ බවට පත්විය. නිදර්ශනයක් වසයෙන් ප්‍රථම ලෝක යුද්ධයට රටවල් 38 ක් ද දශලක්ෂ 74 ක ජනතාවක් ද සහභාගි වූ අතර ඉන් දසලක්ෂ 20 ක ජනතාවක් මිය ගියහ. දෙවන ලෝක මහා සංග්‍රාමයට රාජ්‍යයන් 72 ක් ද දසලක්ෂ 110 ක ජනතාවක් ද සහභාගි වූ අතර ඉන් දසලක්ෂ 55 ක් ජනතාවක් මිය ගියහ. මේ යුද්ධවලින් මිනිසා ලද දැනුම, අත්දැකීම් වටිනාකම් හා සංවේදීතාවන් එක් අතකින් මානව සංහතිය තුළ සාමය පිළිබඳ ආකල්ප හා ක්‍රියාකාරකම් වර්ධනය වීමට ආධාරක වූ අතර අනෙක් අතින් යුද්ධයක් පිළිබඳ දැනුම හා ක්‍රමෝපායයන් වර්ධනයට ඉවහල් විය. දෙවන ලෝක සංග්‍රාමයත් සමග ම යුද්ධය පිළිබඳ සාම්ප්‍රදායික ආකල්ප වෙනස් වන්නට විය. යුද්ධයේ ස්වරූපය පමණක් නොව එහි

ස්වභාවය ද වෙනස් විය. මානව සංහතිය න්‍යෂ්ටික අභ්‍යවකාශ යුගයට ප්‍රවිශ්ට විය. යුද්ධය සිය ඓතිහාසික සීමාවකට ළඟා විය. යුද්ධය සියලු ම දේවල් විනාශ කිරීමේ විස්මිත හැකියාවක් ලබා ගත්තේ ය. න්‍යෂ්ටික යුගය තුළ මානව සංහාරක අවි නිෂ්පාදන තරඟයට මෙන් සිදුවිය. බටහිර ධනවාදී රටවල් හා සමාජවාදී රටවල් අතර ලෝකාධිපත්‍ය සඳහා සිදු වූ මේ මානව සංහාරක අවි තරඟය තුළ මුළු මහත් මිනිස් ප්‍රජාවේ ඉරණම සිරවිය. මේ තත්ත්වය තුළ ලෝකයේ සෑම මිනිසකුට ම සිය ජීවිතයේ වැදගත්කම හා අගය අන් කවරදාටත් වඩා දැනෙන්නට වූ අතර සාමය ජීවිතය බවට පත්විය. සාමය පිළිබඳ ප්‍රශ්නය දාර්ශනිකයින්ගේ, චින්තකයින්ගේ, කලාකරුවන්ගේ, දේශපාලනඥයින්ගේ දැඩි අවධානයට ලක්වන්නට වූවා පමණක් නො ව දසලක්ෂ සංඛ්‍යාත සාමාන්‍ය ජනතාවගේ ක්‍රියාකාරී ආකර්ෂණයට බඳුන්විය. මෙසේ සාමය පිළිබඳ අදහස්, සංකල්ප, අපේක්ෂාවන් හා ක්‍රියාකාරකම් වර්ධනය වන්නට විය. මෙය සාම සංස්කෘතියක් සඳහා වූ පදනම නිර්මාණය කළේ ය. යුද්ධයේ ප්‍රතිපාර්ශ්වය ලෙස සාමය පමණක් විග්‍රහ කිරීම අසාධාරණ වන්නේ ය. යුද්ධය යනු විවිධ හේතු සාධක සමස්තයක ප්‍රතිඵලය වන අතර එය ඉතා දීර්ඝ ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. යුද්ධය එම ක්‍රියාවලියේ වර්ධනයේ කූට ප්‍රාප්තිය යි.

මානව ජීවිතය පවත්වාගෙන යාමේ බටහිර නිෂ්පාදන මාදිලිය ද සමාජයේ සාමකාමී තත්ත්වයට ප්‍රබල බාධාවකි. බටහිර ධනේශ්වර නිෂ්පාදන මාදිලිය මගින් මිනිසා පරිභෝජනීය පැවැත්මක් බවට පත්කොට තිබේ. මෙහි ප්‍රතිඵලයක් වසයෙන් ජීවිතයේ අරුත වූයේ සාමාන්‍ය සරල පැවැත්ම නො ව යම් යම් දේවල් හිමිකර ගැනීම හා අත්පත් කර ගැනීම යි.

මිනිසාගේ නිෂ්පාදන ක්‍රියාකාරිත්වය සහ ස්වාභාවික පරිසර පද්ධතිය අතර සමතුලිත ශක්‍යතාව උල්ලංඝනය වීම මිනිසාගේ පැවැත්ම පිළිබඳ ප්‍රශ්නය මතු කළේ ය. මිනිසාගේ යහපත සඳහා ස්වභාවධර්මය ප්‍රතිසංස්කරණය කිරීම අසීමිත ව කළ හැකි ය යන අදහසත්, මිනිසාට එමගින් ස්වභාවධර්මයේ හාම්පුතා බවට පත්විය හැකි ය යන

අදහසත් අවතක්සේරුවට ලක්විය. අසීමිත ස්වාභාවික සම්පත් භාවිත කරමින් මානව සංහතියට වර්ධනය විය නො හැකි බව 1960 ගණන් වන විට තහවුරු වන්නට විය. මෙය ද සමාජ හා ලෝක සාමයට තර්ජනයක් එල්ල කළේ ය. මීට අමතර ව ලෝක ජනගහන වර්ධනය අසමාන ලෙස විවිධ ජාතීන්ගේ වර්ධනය, යුරෝපීය ජනවර්ගවල සාපේක්ෂ අඩු වීම හා ඔවුන් පෙරදී ලෝකයෙහි ඉසුලූ ස්ථානය නැති වී යාමේ තර්ජනය, ස්වාභාවික පරිසර විනාශ කිරීම හා ස්වාභාවික සම්පත් අඩු වී යාම, ලෝක සාගතය හා දේශගුණික ඛේදවාචකයේ තර්ජනය, වසන්ගත රෝග, අපරාධවල වර්ධනය, සදාචාරාත්මක පිරිහීම හා මානසික අවපාතය ආදි හේතු මානව සංහතියේ සාමයට ප්‍රබල තර්ජනයකි (Lasgo 1977: 406).

මේ සියලු තත්ත්වයන් සාම සංස්කෘතියක අවශ්‍යතාව මතු කරන්නේ ය. එනම් මෙතෙක් මිනිසා ලෝකය කෙරෙහි දක්වන ලද සම්බන්ධතාව මුළුමනින් ම වෙනස් කළ යුතු ය.

මානව සංහතියේ පැවැත්මේ හා ක්‍රියාකාරිත්වයේ ආකාරය ගැඹුරින් විමර්ශනයට භාජනය කළ යුතු ය. ඒ සම්බන්ධ විවිධ අදහස් ක්‍රියාකාරකම්, ඇගයීම්, වටිනාකම්, ප්‍රතිමානයන්, සංවේදීතාවන්, හැසිරීම් රටාවන්, පරිකල්පනයන් මගින් සාම සංස්කෘතිය ගොඩ නැගේ. මේ අනුව සාම සංස්කෘතිය යනු සමාජයේ ජීවත්වන සියලු සාමාජිකයින්, අප ඉහතින් සඳහන් කළ මිනිසාගේ පැවැත්මට තර්ජනයක් එල්ල කරන ප්‍රශ්න පාලනය කර ගැනීමට, විසඳා ගැනීමට, මැඩ පවත්වා ගැනීමට යොමු වූ මානව ක්‍රියාවලිය මගින් උත්පාදනය වන ප්‍රශස්ත වටිනාකම්, අභිමතාර්ථ, විශ්වාසයන්, මත අදහස්, සංකල්ප, න්‍යායන්, විනිශ්චයන් හා ප්‍රතිමානයන්ගේ සමස්තය යි. මිනිසුන්ගේ සමාජ ජීවිතයේ ගුණාත්මක ගති ලක්ෂණයක් ලෙස සාම සංස්කෘතිය හැඳින්විය හැකි ය. මිනිසුන් මිනිසුන් අතරත්, රාජ්‍යයන් රාජ්‍යයන් අතරත්, සංස්කෘතීන් සංස්කෘතීන් අතරත්, ශිෂ්ටාචාර ශිෂ්ටාචාර අතරත් පවත්නා වූ අන්‍යෝන්‍ය සම්බන්ධතාවන් ගුණාත්මක ව හා ප්‍රශස්ත ව පවත්වාගෙන යාමට අවශ්‍ය මානව පුරුෂාර්ථයන්, අවබෝධයන්, හැසිරීම් රටාවන් හා ක්‍රියාකාරකම් සමස්තය සාම සංස්කෘතිය

වශයෙන් හැඳින්විය හැකි ය. සාම සංස්කෘතිය මානව වාදී ශ්‍රමයේ ප්‍රතිඵලයකි. එය මානවවාදී මිනිසාගේ පරිසරය යි. මෙය ජාතික සාම සංස්කෘතියක් සඳහා මෙන් ම ගෝලීය සාම සංස්කෘතියක් සඳහා ද එකසේ ම වලංගු ය. අද්‍යතන ගෝලීය සමාජය සැකසී ඇති ආකාරයට ජාතික සාම සංස්කෘතිය වෙන් කළ නො හැකි ලෙස ගෝලීය සාම සංස්කෘතිය සමග සම්බන්ධ ය. නමුත් අද ජාතික වසයෙන් හෝ ගෝලීය වසයෙන් සාම සංස්කෘතියක් නිර්මාණය කිරීමේ ශක්‍යතාත්මක ප්‍රවණතාවක් තිබේ ද ? අප කවුරුත් මේ ප්‍රශ්නය පිළිබඳ ව ඉතා ගැඹුරින් කල්පනා කළ යුතු ය. වර්තමානයේ දී ජාතික වසයෙන් මෙන් ම ජාත්‍යන්තර වසයෙන් සාමය සඳහා දැඩි ජීවන අවශ්‍යතාවක් තිබුණත් එය සාක්ෂාත් කර ගත නො හැකි වී ඇත්තේ ඇයි ද යන්න සිතා බැලිය යුතු ප්‍රශ්නයකි. අප ජීවත්වන සමාජය තුළ ගොඩනගා ඇති දේශපාලනික හා ආර්ථික ව්‍යුහයන්ගේ මානවීය නොවන ස්වභාවය නිසා ජාතික හා ගෝලීය සාමය ස්ථාපිත කිරීමට නො හැකි වී ඇත. ප්‍රචණ්ඩත්වය සහ අසාධාරණය අවම කිරීම සාමය සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියකි (Wult 1974: 64).

සමාජයේ ස්වභාවය සහ එහි ක්‍රියාකාරීත්වය විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීම ආරම්භ කළ යුතු අතර එහි සංයුක්ත කොටසක් ලෙස සාමය පිළිබඳ අධ්‍යයනය ද ආරම්භ කළ යුතු ය. සාමය පිළිබඳ විද්‍යාවක් හෙවත් සාම වේදයක් වර්ධනය නො කර යථාර්ථවාදී සාම සංස්කෘතියක් ගොඩනැඟිය නො හැකි ය. සාමවේදය මගින් සමාජය තුළ සාමකාමී තත්ත්වයක් පවත්වාගෙන යාමට බාධාකරන හේතු අධ්‍යයනය කිරීමත්, සාමය ස්ථාපිත කිරීමේ මාර්ගයන් හා ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීමත් සිදු කෙරේ. සාමවේදය සමාජ දේශපාලනික හා මනෝවිද්‍යාත්මක අධ්‍යයනයකි. සාමයට තර්ජනයක් එල්ලවන සමාජය තුළ පවතින කොන්දේසි, ව්‍යුහයන් වෙනස් කිරීම හා ඒවා වෙනස් කිරීමේ මාර්ගයන් හා ක්‍රමවේදයන් පිළිබඳ විද්‍යාත්මක දැනුම ගවේෂණය කිරීම සාමවේදය වෙයි. සමාජය තුළ සාමකාමී නො වන තත්ත්වයන් උද්ගත වීමේ විෂය මූලික හා මනෝ මූලික හේතු සහ එම තත්ත්වයන් ජනිත කරන නියමයන්

අධ්‍යයනය කරන විවිධ සංකල්පයන්, න්‍යායන් සාමවේදය මඟින් අධ්‍යයනය කෙරේ. සාමවේදය සමාජයක සාම සංස්කෘතියේ සංයුක්ත කොටසකි.

මානව සමාජයේ සාමකාමී නො වන තත්ත්වයන් පිළිබඳ සදාචාරාත්මක හා මනෝවිද්‍යාත්මක විවේචනයකින් පමණක් සමාජය තුළ සාමය ගොඩනැගිය නො හැකි ය. නමුත් අද්‍යතන ශ්‍රී ලාංකික සමාජය තුළ සාමය පිළිබඳ ව ආධිපත්‍ය දරන ප්‍රවේශය බවට පත් ව ඇත්තේ එක් අතකින් සදාචාරාත්මක හා මනෝ විද්‍යාත්මක ප්‍රවේශයකි. මේ සමාජය යථාර්ථය හා සමාජ නියාමයන් පිළිබඳ අනවබෝධය නිසා හෝ සිතාමතා ම මිනිසුන් මුලාකිරීමේ අරමුණින් සිදුවන ක්‍රියාවලියකි. අනෙක් අතින් සාමය සංකල්පීය වෙළෙඳ භාණ්ඩයක් බවට ජනමාධ්‍යය තුළ පත් වී ඇත. සමාජයට සාමය සාක්ෂාත් කරගත නොහැකි වී ඇත්තේ මිනිසුන් අතර සාමය පිළිබඳ සාදෘශ්‍ය දැනුමක් නොමැතිකම නිසා ය (Bell 1979).

නමුත් දැනුම පිළිබඳ ප්‍රශ්නය පමණක් ම මානව සමාජ සාමය ඌනනය කළ නො හැකි බව අපගේ හැඟීම යි. බටහිරවාදී සමාජ ජීවන මාදිලියේ ස්වරූපයක් නව සාමවාදය හා බැඳුණු ගෝලීයකරණ හා නව ලිබරල්වාදී ප්‍රවණතා ද මානව සමාජ සාමය පවත්වාගෙන යාම සඳහා ප්‍රබල තර්ජනයකි. මේ තත්ත්වයේ දී මිනිසුන්ගේ සංස්කෘතික හා ආධ්‍යාත්මික ජීවිතය තුළට ප්‍රාග්ධනයේ නියාමයන් අවතීර්ණය වී ඒවා මානව සබඳතාවන්ගේ සිට වෙළෙඳපොළ සබඳතා බවට පරිවර්තනය කරන්නේ ය. සංස්කෘතික ජීවිතය අධික ලාභ ලැබිය හැකි ප්‍රාග්ධන ආයෝජනයේ විශේෂ ක්ෂේත්‍රයක් බවට පත්ව තිබේ (Lentz1995:188).

සාමසංස්කෘතියක් ගොඩනැගීමේ දී අද්‍යතන ජනමාධ්‍යවේදයේ වගකීම පිළිබඳ ප්‍රශ්නය තාර්කික තත්ත්වයකට වඩා අතාර්කික තත්ත්වයකි. ඇත්ත වසයෙන් ම ජනමාධ්‍යවේදය සමාජ ජීවිතය තුළ ක්‍රියාකාරී බලවේගය කි. සමාජ ජීවිතයේ සියලු ම ක්ෂේත්‍ර ජනමාධ්‍යවේදයේ අවධානයට හසු වේ. මිනිසාගේ උපතේ සිට මරණය දක්වා

සියලු ක්‍රියාකාරකම් ජනමාධ්‍යවේදයේ අවධානයට යොම ව පවතී. විශේෂයෙන් සමකාලීන ලෝකයේ ආර්ථිකය, දේශපාලනය, සංස්කෘතිය, මතවාදය ආදි ක්ෂේත්‍ර එකිනෙකට වෙන් කළ නො හැකි අන්දමට අන්තර් සම්බන්ධ ව ක්‍රියාත්මක වේ. මේ ක්ෂේත්‍ර අතර ජනමාධ්‍යයට සුවිශේෂ වූ ස්ථානයක් හා කාර්ය භාරයක් පැවරී තිබේ. ජනමාධ්‍යය සමාජයෙන් ම මතුවී සමාජයේ සෙසු සියලු ක්ෂේත්‍ර මත විශේෂ බල ආධිපත්‍යයක් පතුරුවාලයි. ජනමාධ්‍යවේදයේ මධ්‍යගත වීම හා සංකේන්ද්‍රණය වීම ධනවාදයේ වර්ධනයේ පොදු නියාමයට අනුකුල ව සිදු වේ. වර්තමානයේ දී ජනමාධ්‍යවේදය ප්‍රාග්ධනය ආයෝජනයේ සුවිශේෂ ක්ෂේත්‍රයක් බවට පත් වී ඇත. ජනමාධ්‍යවේදය ආයතනයක් වසයෙන් තමන්ගේ ම අරමුණු හා කාර්යය භාරයක් පෙරදැරි කරගෙන ක්‍රියාත්මක වේ. විශාල සමාජ විපර්යාසයන්ට ධනාත්මක හෝ ඍණාත්මක බලපෑමක් කිරීමේ සුවිශේෂ ශක්තියක් ජනමාධ්‍යවේදය සතු ව තිබේ.

ජනමාධ්‍යවේදයට මිනිසුන් දැනුවත් කළ හැකි ය. එසේ ම ඊට බාධා ද කළ හැකි ය. ජනමාධ්‍යවේදය තුළ තොරතුරු විකෘති කිරීම, ආරක්ෂාව විවේචනය, පාලනයට සේවය කිරීම, ව්‍යාපාරවලට සේවය කිරීම, ආණ්ඩුවට බලයේ සිටීමට හෝ විරුද්ධ පක්ෂයට බලයට ඒමට සේවය කිරීම, මංමුලා කිරීම, ඇන්දවීම, සමාජ ජීවිතය පිළිඹිබු කිරීම, යථාර්ථය විකෘති කිරීම, සමාජ සාමයට සේවය කිරීම, යුද්ධයට සේවය කිරීම, කෙටියෙන් ම ප්‍රකාශ කරනවා නම් ජනමාධ්‍යවේදය යනු සමාජීය ජීවිතයේ සියලු ම ක්ෂේත්‍රවල සම්පිණ්ඩිත හරයේ මනෝ මූලික සාධකය යි. ජනමාධ්‍යය යනු දශලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ විඥානය, මනස, සංවේදීතාව, බුද්ධිය, හැඟීම්, රසාස්වාදනය, පරිකල්පනය පමණක් නො ව චර්යාවන්, හැසිරීම් රටාවන්, හැඩගැස්වීමේ ප්‍රබල මෙවලමක් වන අතර එය මිනිසුන් ඒ අරමුණ හෝ ප්‍රවණතාව ඔස්සේ මෙහෙයවීමට තීරණාත්මක බලපෑමක් කිරීමට සමත් සුවිශේෂ බලයකි. මේ අනුව ජනමාධ්‍යය සමාජීය ආයතනයක් වසයෙන් සමාජීය ජීවිතය සංවිධානය කර ගැනීමට, සකස්කර ගැනීමට, ගොඩනගා ගැනීමට ප්‍රබල බලපෑමක් කළ හැකි ශක්‍යතාවයකින් සමන්විත බව කිව යුතු ය. නමුත් අද්‍යතන

ලෝකයේ අපේ සමාජයේ මානව සාමය පිළිබඳ දැඩි අවශ්‍යතාවක් පවතී. දශලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ සාමකාමී ජීවිතයට තිබෙන වුවමනාව, හා අවශ්‍යතාව අදාසන ජනමාධ්‍යවේදය මගින් නිරූපනය වන්නේ ද? කිසිවෙක් ම මේ ප්‍රශ්නයට ඔව් යන පිළිතුර දිය නො හැකි ය. වර්තමාන ලෝකයේ ජීවත් වන බහුතර ජනතාවකගේ ජීවිතය යුද්ධය නො වේ නම් සාමකාමී නො වන තත්ත්වයක පවතී යි. ඒත් මේ තත්ත්වය වෙනස් කිරීමට ජනමාධ්‍යවේදය වගකීමෙන් යුතු ව ක්‍රියාකොට නැතුවා පමණක් නො ව පවතින තත්ත්වය තවත් අයහපත් ලෙස වර්ධනය වීමට ජනමාධ්‍යවේදය ක්‍රියාකොට තිබේ.

සාම සංස්කෘතියක් ගොඩනැගීමේ දී ජනමාධ්‍යවේදයේ වගකීම අතිවිශාල වුවත් අප අපේක්ෂා කරන ආකාරයට සිදු වන්නේ නො වේ.

අද අප රටේ ජාතීන් අතර සම්බන්ධතාව පිළිබඳ ප්‍රශ්නය නිරතුරුව ම ජනමාධ්‍ය තුළ සාකච්ඡාවට භාජනය වේ. නමුත් ජනවාර්ගික ප්‍රශ්නය ජනමාධ්‍යවේදය තුළ සාකච්ඡාවට භාජනය වන පරිස්ථිතිය හා ආකාරය පිළිබඳ ව හා එම් සාකච්ඡා පැවැත්වීමේ පරමාර්ථ පිළිබඳවත් ගැඹුරින් අධ්‍යයනය කළ යුතු ය. එම සාකච්ඡාවත් අදාළ ගැටලුව අවබෝධකර ගැනීම සඳහාත් විසඳීම සඳහාත් විසඳීමේ ක්‍රමවේදයත් සකස්කරගැනීම සඳහාත් කොතෙක්දුරට වැදගත්වන්නේ දැයි සළකාබැලිය යුතු ය. ජනවාර්ගික ප්‍රශ්නය ජනමාධ්‍යවේදය දකින්නේ කෙසේ ද ? අපේ රටේ ජනමාධ්‍යවේදය ජනවාර්ගික ප්‍රශ්නය පිළිබඳ ව දරන ආකල්පය කුමක් ද ?, ජනමාධ්‍යවේදය ජනවාර්ගික ප්‍රශ්නය පිළිබඳ ව දරන ආකල්පය කුමක් වුවත් එකක් ඉතා ම පැහැදිලි ව ප්‍රකාශ කළ හැකි ය. ජනමාධ්‍යවේදය අපේ රටේ ජනවාර්ගික ප්‍රශ්නය ද්විත්වාකාරයකින් භාවිත කරයි. ඉන් එක් ආකාරයක් වන්නේ ජනවාර්ගික ප්‍රශ්නය දේශපාලන බල ව්‍යාපෘතියක කොටසක් ලෙස, කොටසක් වසයෙන් පවත්වාගෙන යාම වන අතර අනෙක් ආකාරය වන්නේ එය වාණිජ ව්‍යාපෘතියේ කොටසක් වසයෙන් පවත්වාගෙන යාමයි. තවමත් අප රටේ ජනමාධ්‍යවේදය ජනවාර්ගික

ප්‍රශ්නය පරමාර්ථයක් වසයෙන් නොගෙන ආකාරයක් වසයෙන් පවත්වාගෙන යාම යි. යම් දෙයක් අරමුණක් වසයෙන් ගැනීමත් ගුණාත්මක වසයෙන් ගැනීමත් එකිනෙකට වෙනස් වූ භාවිතයන් ය. ජනවාර්ගික ප්‍රශ්නය අරමුනක් ලෙස සළකා එය සාකච්ඡාවට භාජනය කිරීම තුළ මානවවාදී ස්වභාවයක් දක්නට ලැබෙන අතර එම ආකාරයක් වසයෙන් සළකා සාකච්ඡාවට භාජනය කිරීම තුළ නිර්මාණවාදී(අමානුෂීය) ස්වභාවයක් දක්නට ලැබේ. මින් පළමුවැන්න සිදුවිය හැක්කේ උසස් සාම සංස්කෘතික සන්දර්භයක් තුළ පමණි.

සංවර්ධිත ජනමාධ්‍යවේද සංස්කෘතියකින් තොර ව සාම සංස්කෘතියක් පවත්වාගෙන යා නොහැකි ය. මක් නිසාද යත් සාම සංස්කෘතිය හැඩගැස්වීමේ දී ප්‍රධාන භූමිකාවක් ජනමාධ්‍යවේදය සංස්කෘතියට හිමිවන බැවිනි. ඇත්ත වසයෙන් ම සාම සංස්කෘතිය හා ජනමාධ්‍ය සංස්කෘතිය අන්‍යොන්‍ය වසයෙන් සහසම්බන්ධිත වේ. එකිනෙකාව අනෙකා ආකල්පනය කරයි.

සාම සංස්කෘතියක් ගොඩනැගීමේ ක්‍රියාවලියේ දී ජනමාධ්‍යවේදයේ වගකීම හා වැදගත්කම අති විශාල වුවත් අද්‍යතනයේ දී ලෝකයේ ආධිපත්‍ය දරන ජනමාධ්‍ය භාවිතය තුළ ඉන් එවැන්නක් අපේක්ෂා කළ නො හැකි ය. වර්තමාන ලෝකයේ ක්‍රියාත්මක වන ආර්ථික, දේශපාලන හා ශික්ෂණ ව්‍යුහයන් ඒ හා සම්බන්ධ පුරුෂාර්ථ, හර හා ඇගැයීම් පද්ධතිය සාම සංස්කෘතියක් ගොඩ නැගීමට තිබෙන ප්‍රබලතම බාධාවක් බව අවසාන විග්‍රහයේ දී පැහැදිලි වේ. එසේ ම ජනමාධ්‍යවේ දී නිර්මාණයත්හි අන්තර්ගතය හා ආකෘතිය වැනි තොරතුරු ඉදිරිපත් කිරීමේ ස්වරූපයක් ද සාම සංස්කෘතියක් ගොඩ නැගීම සඳහා යෝග්‍ය නොවන වාතාවරණයක් නිර්මාණය කරයි. මීට හොඳ ම නිදර්ශනය වන්නේ සමකාලීන ලෝකය ජනමාධ්‍යවේදය සමඟ දක්වන සම්බන්ධතාවයි (Wheeler 1976 :132).

වර්තමාන සමාජයේ සියලු ම සන්නිවේනාත්මක ව්‍යුහයන් ජනමාධ්‍යවේදයේ පාලනය හා ආධිපත්‍ය යටතේ ක්‍රියාත්මක

වේ. සන්නිවේදන ව්‍යුහයන් මත ජනමාධ්‍යවේදයේ බලපෑම් නිසා ඒවා විනෝදාස්වාදය, තොරතුරු විකෘති කිරීම, ආදිය කෙරෙහි අතිවිශාල අවධානයක් යොමු කරනු ලැබේ සමාජයේ සමස්ත සන්නිවේදන ක්‍රියාවලිය ම එක් අතකින් වාණිජකරණයට හා දේශපාලනිකරණයට ලක් වී ඇති අතර අනෙක් අතින් දේශපාලනය හා වාණිජ්‍යය ජනමාධ්‍යකරණය වී ඇත . වර්තමාන ජනමාධ්‍යවේදය තුළ මේ ප්‍රවණතාවන් දෙක අන්‍යෝන්‍ය වසයෙන් අන්තර් සහ පැවැත්මක් තුළ ක්‍රියාත්මක වන්නේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සැබෑ සමාජීය ප්‍රශ්න, මිනිස් අවශ්‍යතාවන් පරාරෝපණයට භාජනය විය. ජනමාධ්‍යවේදය සමාජය තුළ සැබෑ ජනමතය පිළිබිඹු නො කිරීම තුළ සමාජ යථාර්ථය හා ජනමාධ්‍යවේද යථාර්ථය අතර විශාල පරතරක් දක්නට ලැබේ.

සැබෑ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, ශික්ෂණමය ගැටලු නිමිති කොටගෙන මාධ්‍ය භාවිතය ආරම්භ කළත් එම භාවිතය ඉතා ඉක්මනින් සමාජ යථාර්ථයෙන් මාධ්‍ය යථාර්ථයට අවතීර්ණය වේ. මේ තත්ත්වයේ දී ජනමාධ්‍යවේදය සැබෑ සමාජ ගැටලු සාකච්ඡා කිරීම වෙනුවට එම ගැටලුවල පරමාදර්ශී ස්වරූප පිළිබඳ ද සාකච්ඡා කරනු ලැබේ. මෙහි දී ජනමාධ්‍යවේදය සමාජයේ සැබෑ අවශ්‍යතාවන් නියෝජනය කිරීම පසෙක දමා පුද්ගලික ස්වරූපයේ ප්‍රාථමික සහජාසයන් ස්පර්ශ කිරීම ප්‍රවේශ වේ. එනම් ජනමාධ්‍යවේදය සමාජීය රාමුවක සිට නිර්සමාජීය රාමුවකට පරිවර්තනය වේ.

විද්‍යාවේ සහ තාක්ෂණයේ විශේෂයෙන් ම ඒ හා බැඳුණු විඥාපන මාධ්‍යයන්ගේ දියුණුව නිසා එක්වරම හඳුනා ගත නොහැකි අන්දමට යථාර්ථයේ හා පරිකල්පනයේ විවිධ සාධක හා තත්ත්වයන් මිශ්‍ර කිරීම සිදුවේ. ඇති දේ නැති හැටියටත්, නැති දේ ඇති හැටියටත්, පවතින්නට සැලැස්වීම මෙම මාධ්‍ය භාවිතයේ මූලික ලක්ෂණයයි. අද්‍යතන ජනමාධ්‍යවේදයේ ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස වේශ නිරූපණකරණයේ ප්‍රවණතාවන් උත්සන්න වන බව දක්නට ලැබේ. එනම් සංකේත යථාර්ථයෙන් විස්ථාපනය වූ යම්කිසි ස්වාධීන පැවැත්මක් අත්පත් කර ගනී. මෙය එක්වරම සිදු නොවන

අතර එය ක්‍රමානුකූලව සිදුවන ක්‍රියාවලියකි. මුලින්ම සංකේත මගින් සමාජ යථාර්ථයේ යම් කිසි ගැඹුරක් පරාවර්තනය කරයි. ඉන් අනතුරු ව යථාර්ථය විකෘති කිරීම හා වසන් කිරීම කරයි. මීළඟ පියවර වන්නේ යථාර්ථයේ කිසිම ගැඹුරක් නැති බව වසන් කරන අතර අවසාන ප්‍රතිඵලය වන්නේ මිනිසා යථාර්ථය සමඟ ඇති සියලු ම සම්බන්ධතා නැතිකරගැනීම යි (වීරසිංහ 2002 -124).

මේ තත්ත්වය තුළ මිනිසා සමාජය තුළ මුහුණ පාන සැබෑ ප්‍රශ්නවලින් සිය අවධානය තාවකාලික ව හෝ ඉවත්කොට යොමු කිරීමක් සිදු වේ. මේ සමාජය තුළ ප්‍රබල ගැටලු මතු කරන අතර ඉන් සමහර ඒවා තියුණු ගැටුම් දක්වා ද වර්ධනය කළ හැකි ය. මෙහි දී අපට පැන නැගෙන ප්‍රශ්නය වන්නේ මේ ජනමාධ්‍ය භාවිතය සමාජය පිළිබඳ සවිඥානික වගකීමකින් යුතුව සිදුවන්නක් ද එසේ නොවේ නම් මෙය ප්‍රති ජනමාධ්‍ය භාවිතයක් ද ඇත්ත වසයෙන් මෙවැනි ජනමාධ්‍ය භාවිතය ප්‍රතිජනමාධ්‍ය භාවිතයක් වන අතර නිර්සමාජීය හා නිර්මාණවාදී ප්‍රභවය එහි හරය වසයෙන් දැක්විය හැකි ය.

සාම සංස්කෘතියක් ගොඩ නැගීම මෙවැනි ජනමාධ්‍ය භාවිතයකින් කිසිසේත් ම කළ නො හැකි ය. ජනමාධ්‍ය සමාජයේ ජීවත්වන පොදු බහු ජනතාවගේ මූලික අවශ්‍යතාවන් ඉටු කිරීමෙන් ඉවත් වී ඇති අතර ඒ නිසාම එය පොදු බහු ජනතාවගේ ජීවන ශෛලීය අත්‍යාවශ්‍ය සංඝටකයක් නොවන තත්ත්වයට පත් වී තිබේ. සමාජීය පුද්ගලයාගේ එදිනෙදා ජීවන සත්තාවේ ප්‍රකාශකයාගේ තත්ත්වයෙන් ජනමාධ්‍යවේදය ඉවත් වී එය නිර්සමාජීය සංරචකයක් බවට පත් වෙයි. සමාජයේ මෙහි දී ජනමාධ්‍යවේදයේ නිර්සමාජියත්වය යන සංකල්පයෙන් අප අදහස් කරන්නේ සමකාලීන ජනමාධ්‍යවේදය සමාජීය සන්දර්භයකින් තොර වීම හෝ හීන වීම ය. එසේ ජනමාධ්‍යවේදින් තුළ ද සමාජීය සංවේදීතාව, සමාජීය ස්ව විඥානය සමාජීය සුහදත්වයේ අසංවර්ධිත මට්ටමකින් පවතී . මීට සරිලන ආකාරයට ජනමාධ්‍යවේදියාගේ ක්‍රියාකාරිත්වයේ ගති ලක්ෂණ නිර්ණය වෙයි. මේ තත්වය මානව සමාජයේ

සමාජ සාමය පවත්වා ගෙන යාමට තර්ජනයක් එල්ල කරන්නේ ය.

සාම සංස්කෘතියක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේ දී ජනමාධ්‍යවේදයේ වගකීම එයට ඉටු කළ හැකි වන්නේ අන් සැමට කලින් ජනමාධ්‍යවේදය සමාජීය සන්දර්භය තුළට ප්‍රවේශ වීමෙනි. එසේ නොවන තෙක් ජනමාධ්‍යවේදය තුළ කතිකාවකට ලක්වන විවිධ සමාජ සංස්කෘතික හා දේශපාලන මාතෘකා අර්ථ විරහිත වන්නේ ය. නිදර්ශනයක් වශයෙන් සමකාලීන ජනමාධ්‍යවේදය තුළ විශාල අන්දමට සාකච්ඡාවට ලක්වන ධනාත්මක චින්තනය ජනවාර්ගික ප්‍රශ්නය සම්බන්ධ විවිධ සාකච්ඡා විශ්වවිද්‍යාල හා පාසල් ශිෂ්‍ය විනය පිළිබඳ වැඩ සටහන් රටේ අපරාධ රැල්ල පිළිබඳ හා වෙනත් සමාජ, දේශපාලන ශික්ෂණමය ගැටලු පිළිබඳ සාකච්ඡාවලින් ජනමාධ්‍ය පිරී පවතී. රටක උසස් ජනමාධ්‍ය සංස්කෘතියක් හා සාම සංස්කෘතියක් ගොඩ නැගීමේදී අදාළ රටේ ඉහත අප සඳහන් කළ ගැටලු සාකච්ඡා වීම පමණක් ප්‍රමාණවත් නො වේ. එම ගැටලු සාකච්ඡා කරන අන්දම අදාළ ගැටලුවල ස්වභාවය නිශ්චිත සමාජ සන්දර්භ තුළ විශ්ලේෂණය කිරීම එම ගැටලුවල සම්භවය හා විකාශනය විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විමර්ශනය කිරිම ඒවා විසඳීමේ ක්‍රමවේදයන් පෙන්වා දීම ආදිය ද අත්‍යවශ්‍ය වන්නේ ය. සමාජයේ පවතින ගැටලු සාකච්ඡාවට ලක්කිරීම අදාළ ගැටලු විසඳීමේ එක් පියවරක් පමණි. සකච්ඡාවලින් පමණක් සමාජ ගැටලු විසඳිය නො හැකි ය. එම ගැටලු විසඳීමට යොමු වූ සක්‍රීය බලවේගයන් සමාජය තුළ වර්ධනය වීම හා ගොඩ නැගීමට ජනමාධ්‍යවේදය සමත් විය යුතු ය. නමුත් කළ හැක්කේ ජනමාධ්‍යවේදය එම සමාජ ගැටලු සිය ක්‍රියාකාරිත්වයේ පරමාර්ථයක් වශයෙන් සැලකීමෙනි. නමුත් අද්‍යතන ජනමාධ්‍යවේදය ක්‍රියාත්මක වන්නේ එම ගැටලු සාකච්ඡා කිරීම ජනමාධ්‍යවේදයේ පැවැත්ම හා උවමනාවන් සඳහා මාධ්‍යයක් ආකාරයක් කර ගනිමිනි. අප ඉහත සඳහන් කළ සියලු සාකච්ඡා සහ සංවාද ජනමාධ්‍ය තුළ සිදුවන්නේ සැබෑ ලෙස එම ගැටලු සමාජයට අවබෝධ කර ලීමේ හා ඒවා විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සම්පාදනය කිරීමේ පරමාර්ථ ය නොවේ. මෙහි දී අද අපේ රටේ ජනමාධ්‍ය තුළ සාකච්ඡා

කෙරෙන මාතෘකා සම්බන්ධ ව ප්‍රශ්න කිහිපයක් ඇසිය යුතු ය.

ඉහත අප සඳහන් කළ මතෘකා තුළ සාකච්ඡා විවිධ ජනමාධ්‍ය ආයතන සූදානම් කරන්නේ ඇයි? ග්‍රාහකයින් එම වැඩ සටහන් නරඹන්නේ හෝ අසන්නේ ඇයි?

ජනමාධ්‍ය ආයතන ඉහත මාතෘකා පිළිබඳ වැඩ සටහන් සූදානම් කරන්නේ සිය මාධ්‍ය ආයතනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මුදල් සොයාගැනීමට මිස අදාළ සමාජ ගැටලුව පිළිබඳව සමාජය දැනුවත්කොට එය විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නොවේ. සම්පත් දායකයින් ඊට සහභාගි වන්නේ අදාළ සමාජ ගැටලුව පිළිබඳ විද්‍යාත්මක හා යථාර්ථවාදී අවබෝධයක් ග්‍රාහකයින්ට ලබා දී අදාළ සමාජ ගැටලුව විසඳීමට සක්‍රීය මැදිහත්වීමක් කිරීමේ අපේක්ෂාවෙන් නොව ඔවුන්ගේ පුද්ගලික වුවමනාවන් හා අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට ය. නිදර්ශනයක් වසයෙන් පාසැල් විනය පිරිහීමට සම්බන්ධ සංවාදයකදී සංවාද මණ්ඩපයේ මූලික අවධානය යොමුවන්නේ වර්තමාන සමාජය තුළ ජීවත් වන සැබෑ ශිෂ්‍යයා වෙත නොව යම්කිසි පරමාදර්ශී ශිෂ්‍යයකුවෙත ය. පාසැල් ශිෂ්‍යයා මෙවැන්නෙකු විය යුතු ය. ඔහු වත්තේ පිටියේ දුව පැන සෙල්ලම් කළ යුතු ය. සමවයසේ අය සමග ඇසුරු කළ යුතු ය. පාඩම් කළ යුත්තේ මේ පිළිවෙලට ය. ඔහු බැලිය යුත්තේ, ඇසිය යුත්තේ මේවා ය. ආදි වශයෙන් "විය යුතු", "කළ යුතු", දේවල් පිළිබඳ ව විශාල උපදෙස් මාලාවක් ග්‍රාහකයින් හමුවේ තබයි. නමුත් සමාජය තුළ සැබෑ ලෙස ජීවත් වන ශිෂ්‍යයා ඊට වඩා හාත්පසින් ම වෙනස් ය. ඔහු බලන දේවල් වෙනස් ය. කරන කියන දේවල් වෙනස් ය. ඔවුන්ගේ ජීවන චර්‍යාව හා හැසිරීම් රටාව ද අර සාකච්ඡාවට බඳුන් වන පරමාදර්ශී ශිෂ්‍යයාට වඩා සම්පූර්ණයෙන් ම වෙනස් ය. දශ ලක්ෂ සංඛ්‍යාත දෙමව්පියෝ (ග්‍රාහකයෝ) ඉතා විමතියෙන් සාකච්ඡා මණ්ඩපය දෙස බලා අසා සිටිති. මෙය ඔවුන්ගේ සැබෑ දරුවා පිළිබඳ ව කතා නො කළත් සැබෑ දරුවා මුහුණපා සිටින කර්කශ යථාර්ථයෙන් පලායාමක් වසයෙන් මොහොතකට හෝ අර පරමාදර්ශී

ශිෂ්‍යයා ගැන සාකච්ඡා මණ්ඩපයෙන් ගිලිහෙන වදන් දෙමාපියන්ගේ මනදොල සිසිලස් කරයි.

''මෙහිදී පරමාදර්ශී ශිෂ්‍යයාත් සැබෑ ශිෂ්‍යයාත් අතර ඇති පරතරය ජනමාධ්‍යවේද ප්‍රාග්ධන ආයෝජනයට කදිම අවස්ථාවකි''.
අභාග්‍යකට මෙන් ජනමාධ්‍ය තුළ මෙවැනි සාකච්ඡාවලින් අඩුවක් නැතත් සාකච්ඡාවලට අදාළ සමාජ යථාර්ථය (සැබෑ සමාජ ගැටලු) කිසිම ලෙසකින් විසඳී නැතුවා පමණක් නොව එන්න එන්නම එම ගැටලු වර්ධනය වෙමින් උත්සන්න වන බව පෙනේ.

සමකාලීන ජනමාධ්‍යවේදය තුළ සිදුවන සියලුම සාකච්ඡා මෙවැනි සන්දර්භයක් තුළ සිදුවන බව පැහැදිලි ය. මේ තත්ත්වය තුළ අද්‍යතන ජනමාධ්‍යවේදය සමාජය මතින් යැපෙන පෝෂණය වන සමාජය මත සිය ආධිපත්‍ය පතුරුවාලන දශලක්ෂ සංඛ්‍යාත මිනිසුන් චින්තන සංවේදිතාවන් බුද්ධිය හැසිරීම් රටා හා චර්යාවන් මත සිය බලය පවත්වාගෙන යන ඒවා තමන්ට අභිමත පරිදි හැඩගැස්වීමට ප්‍රබල බලපෑමක් කරන දශලක්ෂ සංඛ්‍යාත ජනතාව තමන්ගේ පැවැත්ම සඳහා පාවිච්චි කරන බලවේගයක් බවට පත් වී තිබේ.

නිගමනය
මේ අනුව අපට පෙනී යන්නේ සාම සංස්කෘතියක් ගොඩනැගීම සඳහා ජනමාධ්‍යවේදයේ වගකීම අති විශාල වුවත් නමුත් එය සක්‍රීය ලෙස සිදුවිය හැක්කේ අද්‍යතන ජනමාධ්‍යවේදය ක්‍රියාත්මක වන නිශ්චිත සමාජ, දේශපාලනික, ආර්ථික සහ දෘෂ්ටිමය ව්‍යුහයන් ගැඹුරු වෙනස් කිරීමකට ලක් කිරීමෙනි.

වර්තමානයේ ශ්‍රී ලාංකේය ජනමාධ්‍යවේදය තුළ ආධිපත්‍ය දරණ සාම මතවාදය ද ක්‍රියාත්මක වන්නේ සැබෑ සාමයක් හෝ සාම සංස්කෘතියක් ගොඩනැංවීමේ පරමාර්ථයෙන් නොවේ. එය ශ්‍රී ලාංකේය සමකාලීන ජනමාධ්‍යවේදයේ පැවැත්මේ ආකාරයකි. මෙහි දී ජනමාධ්‍යවේදය සාම

මතවාදය සිය අරමුණු ඉටුකරගැනීම සඳහා පාවිච්චි කරනු ලැබෙයි. වර්තමාන ශ්‍රී ලාංකේය ජනමාධ්‍යවේදය තුළ සංස්කරණය වන තොරතුරු අන්තර්ගත විශ්ලේෂණයකට ලක් කිරීමෙන් ඒ බව කාටත් අවබෝධ කොට ගත හැකි ය.

මේ අනුව වර්තමාන ගෝලීය සමාජය තුළ ජීවත්වන අප සෑම පුද්ගලයකුගේ ම ජීවන අවශ්‍යතාවක් බවට ගෝලීය සමාජ සාමය අත්‍යවශ්‍ය ව තිබේ. නමුත් ගෝලීය සමාජය තුළ ඊට විරුද්ධ බලවේග ක්‍රියාත්මක වේ. එම බලවේග ක්‍රියාත්මක වන සමාජ - ආර්ථික -දේශපාලන ව්‍යුහයන් වෙනස් කිරීම සඳහා වූ ක්‍රියාකාරී ව්‍යාපාරයකින් හා පොදු බහු ජනතාවගේ . වුවමනාවන් නියෝජනය කරන මතවාදයකින් තොර ව ජාතික හෝ ගෝලීය සාම සංස්කෘතියක් පිළිබඳව කතා කිරීම නිෂ්ඵල වේ. මානව සමාජය සඳහා සැබෑ සාමය, එය අඛණ්ඩ ක්‍රියාවලියකි. එසේම මානව සංහතිය සංවිධානය වී ඇති ස්වභාවය අනුව සාම සංස්කෘතිය යනු ද අඛණ්ඩ ක්‍රියාවලියක් තුළ ගොඩ නැගෙන්නකි. වර්තමාන අප ජීවත්වන ගෝලීය සමාජය සංවිධානය වී ඇති ආකාරය අනුව අර්බුධ, ගැටුම්, යුද්ධ කලාපීය වසයෙන් මෙන්ම ගෝලීය වසයෙන් ද තවතවත් වර්ධනයවීමේ ප්‍රවණතාවක් පෙනෙන්නට තිබෙයි. ඊට අමතරව මානව සංහතියේ ක්‍රියාකාරීත්වය නිසා එන්න එන්නම ගෝලීය ගැටලු උත්සන්න වන බව පෙනේ. එසේ ම මිනිසුන් මගින් මානවවාදී ගුණාංග නැතිවී යාමේ තත්ත්වයක් ද සමාජ අසාධාරණත්වය හා වෙනත් සමාජ විෂමතා වර්ධනය වීමක් ද දක්නට ලැබෙයි. සියලු ම සමාජවල පවතින සාරධර්ම, ආචාර ධර්ම අවතක්සේරුවට ලක්වෙමින්, පොදුවේ සමාජය තුළ නිර්මානවිය තත්ත්වයක් නිර්මාණය වීමේ ලක්ෂණ ඉස්මතුවී තිබේ. මේ සියලු කාරණා පවතින මානව සමාජ සංවිධාන රටාව ගැඹුරු ප්‍රශ්න කිරීමකට ලක් කරණ අතර ඊට විකල්පීය වසයෙන් නව ශිෂ්ටාචාරයක අවශ්‍යතාව සංකේතවත් කරන්නේ ය.

මිනිසුන් ජීවත්වන සමාජ මානවවාදී ස්වභාවයක් ගන්නාවිට දී සාමසංස්කෘතියක් ගොඩනැංවීම සඳහා ජනමාධ්‍යවේදයේ

වඝසිම අදට වඩා තර්ජිත වූ ද ප්‍රකෝපිත වූ ද සවිඥානිත වූ ද රූපයක් ගනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


වීරසිංහ, විපුධර්. *2002 ගෝලීය සමාජය සහ එහි මානවවාදය.* මරදාන: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Beales, A.C.F. 1937. *The history of peace*. A short account of the organized movements for international peace.

Bell, D. 1979. *The Cultural Contdictions of Capitalism*. London:

Lasglo, E. 1977. *Goals for Mankind*. A Report to the Club of Rome on the New Hornzons Global Community. N.Y.

Lentz, T. 1955: *Toward a Sciences of peace*.Turning point in Human Destiny. London:

Mumford, P.H.S. 1937. *An introduction to Pacifism*. London:

Wheeler, M. Lies. 1976. *Damn Lies and Statistics*. The manipulation of public opinion in America. N.Y.

Wulf, F. 1974. *Handbook on peace Education*. OSLO: